ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1478/8 – 2007 ජනවාරි 01 වැනි සඳුදා – 2007.01.01

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත

7 වැනි වගන්තිය යටතේ නියෝගය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වගන්තිය සමග කියවිය යුතු 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතේ 7 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, එකී පනතේ එකී වගන්තිය යටතේ සාදා, 1993 ජනවාරි 29 දිනැති අංක 751/20 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයෙහි පළ කරන ලද්දා වූ ද, එකී වගන්තිය යටතේ සාදා 2001 ඔක්තෝබර් 12 වැනි දිනැති අංක 1205/29 දරන *අති විශෙෂ ගැසට්* පත්‍රයෙහි පල කරන ලද නියෝගයෙන් අවසන් වරට සංශෝධනය කරනු ලැබුවාවූද, නියෝගයේ 2006 දෙසැම්බර් මස 31 දින මධ්‍යම රාත්‍රියේ/2007 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම නියෝගයෙන් සංශෝධනය කරමි.

(1) 1993 ජනවාරි 29 දින සහ අංක 751/20 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 4 A පිටුවෙහි දැක්වෙන නියෝගයේ 1 වන උප ඡේදයේ සියලු වචන සහ ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ විය යුතුය.

"(ඒ) යම් ව්‍යාපාරයක පිරිවැටුම් සම්බන්ධයෙන් :-

- මෙහි උපලේඛනයේ IX වැනි කොටසට .........ප්‍රතිශතය 1
- මෙහි උපලේඛනයේ IX අ වැනි කොටසට .........ප්‍රතිශතය 5"

(2) මෙහි උපලේඛනයේ IX වැනි කොටසේ අවසානයට පහත සඳහන් දෑ එකතු කිරීමෙන් :-

"IX අ වන කොටස (5%)

නිෂ්පාදකයාගෙන් හෝ ආනයනකරුගෙන් මිළට ගෙන මත්පැන් සහ සිගරට් විකිණීමේ ව්‍යාපාරය"

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති,
(මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.)

2006 දෙසැම්බර් 29 වැනි දින,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

01-287

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.